**නවගත්තේගම ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජූලි 24 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට නවගත්තේගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේදී නවගත්තේගම මහජන පුස්තකාලයේ ළමා අංශය කොටස් කර වෙන්කිරීම සඳහා වැයවූ රු.102,490ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ජර්නල් සටහන් මගින් නිවැරදි කර ඇති බව කාරුණිකව දන්වමි. |
| (ii) | ජල පිරිපහදු මධ්‍යස්ථානයෙන් ඉවත් කළ ද්‍රව්‍ය භාවිතා කර අළුතින් සකස් කරන ලද මේස 03ක් හා රාක්ක 04ක් සඳහා දරන ලද වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වටිනාකම් තක්සේරු කර ප්‍රාග්ධනිත කළ යුතු වේ. | වටිනාකම් තක්සේරු කිරීම සඳහා කමිටුවක් පත් කර එම කමිටුවේ නිර්දේශ මත එම වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**(ආ ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 21ක එකතුව රු.10,316,629ක් වූ අතර ඒ අතරින් වසර 05 ඉක්මවා ලැබිය යුතු ශේෂය රු.95,058ක් විය. | ලැබිය යුතු ගිණුම් ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | දොරින් දොරට ගමින් ගමට 2014 ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කළ කර්මාන්ත 8කට අදාළව තව දුරටත් ලැබිය යුතුව පවතින රු.95,058ක් අයකර ගැනීමට අදාළව ලිඛිත ඉල්ලීම් කර ඇති බව කාරුණිකව දන්වමි. අනෙකුත් ලැබිය යුතු වටිනාකමින් රු.1,676,943ක් තවදුරටත් ලැබිය යුතුව පවතින බව දන්වමි. |
| (ii) | 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 08ක එකතුව රු.7,645,702ක් වූ අතර ඒ අතරින් වසර 05 ඉක්මවූ ගෙවිය යුතු වටිනාකම රු.95,082ක් විය. | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | 2014 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද දොරින් දොරට ගමින් ගමට ව්‍යාපෘතිය යටතේ වූ කර්මාන්ත වෙනුවෙන් ගෙවිය යුතු රු.95,082ක් ගෙවීමට නොහැකි වූයේ ඒ සඳහා ප්‍රතිපාදන නොලැබීම නිසා බව කාරුණිකව දන්වමි. අනෙකුත් ගෙවිය යුතු ණයහිමි රු.1,127,348ක් තවදුරටත් පවතින බව දන්වමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.76,436,378ක් වූ ගිණුම් විෂයයන් 02ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව නඩත්තු කළ යුතු වේ. | ලී බඩු හා සවිකිරීම් ලේඛනය සකස් කර ඇති බව දන්වන අතර එහි ඇති අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. පී.එස්. 46 ආකෘතිය ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය සකස් කර ඇති බව දන්වමි. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| 127 වගන්තිය | සුසාන භූමි හා මිනී පිටි ආඥා පනතේ 03 වන වගන්තියේ කාර්යය සඳහා සෑම ප්‍රාදේශීය සභාවක්ම තම සීමා ඇතුළත නිසි බලධාරියා වුවත් බල ප්‍රදේශයේ සුසාන භූමි 23ක් සභාවට පවරාගෙන නොතිබුණි. | සභාවට අයත් සුසාන භූමි කඩිනමින් පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභාවට අයත් සුසාන භූමි 23 පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව කාරුණිකව දන්වමි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) අංක 5(3) රීතිය | ආදායම් එක්රැස් කිරීම සම්බන්ධයෙන් අභ්‍යන්තර පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර පරීක්ෂාවක් සිදු කළ යුතු වේ. | ආදායම් එක්රැස් කිරීම සම්බන්ධයෙන් අභ්‍යන්තර පරීක්ෂාවක් සිදු කරන බව කාරුණිකව දන්වමි. |
| (ii) අංක 5 (7) රීතිය | මූල්‍ය හා ගබඩා කටයුතු සම්බන්ධයෙන් සම්පූර්ණ කාල පරිච්ඡේදය ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනය සිදු කළ යුතු අතර, විගණන වාර්තා විගණකාධිපති වෙත එවිය යුතු වේ. | මූල්‍ය හා ගබඩා කටයුතු සම්බන්ධයෙන් සම්පූර්ණ කාලපරිච්ඡේදය ආවරණය වන ලෙස අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට නොහැකි වූ බව පිළිගන්නා අතර 2020 වර්ෂයේදී එය නිවැරදිව සිදු කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.1,759,111ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,753,151ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 වර්ෂය | | | | 2018 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 554 | 685 | 696 | 10 | 386 | 488 | 467 | 21 |
| කුලී | 5,440 | 4,738 | 4,750 | 10 | 1,699 | 4,052 | 4,031 | 22 |
| බලපත්‍ර ගාස්තු | 187 | 180 | 180 | - | 149 | 208 | 208 | - |
| වෙනත් ආදායම් | 6,506 | 4,282 | 5,145 | 390 | 3,188 | 2,312 | 1,059 | 1,253 |
| | 12,687 | 9,885 | 10,771 | 410 | 5,422 | 7,060 | 5,765 | 1,296 |

*රැස්කළ ආදායම තුල වර්ෂයේ බිල්කළ ආදායමෙන් රැස්කළ ආදායම සහ හිඟහිටි ආදායමෙන් රැස්කළ ආදායමද ඇතුලත්ව තිබේ.

**2.2.2 වෙනත් ආදායම්**

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් කුට්ටි ගල් ව්‍යාපෘතියෙන් ලැබිය යුතු රු.389,912ක් අය කරගෙන නොතිබුණි. | ලැබිය යුතු හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | කුට්ටිගල් ව්‍යාපෘතියෙන් ලැබිය යුතු රු.389,912ක් මේ වන විට හරස් සටහන් මගින් අයකරගෙන ඇති බව දන්වමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 කාර්යසාධනය**

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ නිරීක්ෂණයන් පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් කරුණු 15ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | නවගත්තේගම ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන්නේ සම්මත අතුරු ව්‍යවස්ථා වේ. අනෙකුත් ක්ෂේත්‍ර සඳහා ප්‍රාදේශීය සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතු වුවද ඒ සඳහා සභාව විසින් අතුරු ව්‍යවස්ථා සකස් කිරීමේදී ඇති වන නීතිමය දුර්වලතා නිසා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ගැනීමේදී ගැටළු ඇති වන බැවින් ප්‍රාදේශීය සභාව විසින්ම සකස් කර සම්මත කර ඇති අතුරු ව්‍යවස්ථා නොමැති බව කාරුණිකව දන්වමි. |

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂයේදී සභාවට පවරාගත් ඉඩමකට නගරයේ කසළ එක්රැස් කර බැහැර කිරීම සිදුකර තිබුණි. | විධිමත් ආකාරයට කසළ බැහැර කිරීම් සිදුකළ යුතු වේ. | සන්දනන්කුලම ඉඩම ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානක් ඉදි කිරීම සඳහා වෙන්කර මේ වන විට එහි ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතින අතර ඉදිරියේදී විධිමත් ආකාරයෙන් කසළ බැහැර කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

--------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" ප්‍රකාරව ළඟා කරගත යුතු අරමුණු හා ඉලක්ක කරා ළඟාවීමට සූදානම පිළිබඳ පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු 06ක් සඳහා ඉලක්කයන් 23ක් හඳුනාගෙන එම අරමුණු හා ඉලක්ක ළඟා කරගැනීමේ ක්‍රියාකාරකම් රාශියක් ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රගතිය අවම මට්ටමක පැවතුණි. | සැලසුම් කළ අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීම සඳහා සකස් කර ඇති සැලසුම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇති බව දන්වමි. |
| (ii) නගරයේ ජලය බැස යන ස්ථිර කාණු පද්ධතිය කිලෝ මීටර් 02ක් දක්වා දීර්ඝ කිරීම, මහජන පුස්තකාල සඳහා අන්තර්ජාල පහසුකම් ලබාදීම, බල ප්‍රදේශයේ පුස්තකාල 02ක් ඉදිකිරීම යන ව්‍යාපෘති තිරසර සංවර්ධන ඉලක්ක යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද 2019 ප්‍රතිපාදන අනුමත නොවීම නිසා වර්ෂය තුල අදාල ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි. | සැලසුම් කළ අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සකස් කර ඇත්තේ 2020-2030 කාල සීමාව තුල ළඟා කර ගැනීම සඳහා වන අතර එහි සඳහන් ඉලක්ක අදියර වශයෙන් ඉදිරි වසර 10 තුලදී ළඟා කර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නවගත්තේගම නගර සීමාව තුල වරිපනම් ආදායම් රැස් කර ගැනීමට හැකි මට්ටමට පහසුකම් වැඩිදියුණු වී තිබීම හේතුවෙන් අදාළ ප්රදේශ හඳුනාගෙන සිතියම් ගත කර අදාළ ප්‍රදේශ පරීක්ෂා කිරීම හා කුලී දේපළ හඳුනා ගැනීම් සිදු කළද දේපළ තක්සේරු කර වරිපනම් ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | වරිපනම් ගාස්තු පනවා අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | වරිපනම් ගාස්තු අයකිරීමට අදාළව මේ වන විට අදාළ ප්‍රදේශය ගැසට් කර අවසන් අතර තක්සේරු දෙපාර්තමේන්තුවේ සහායෙන් දේපළ තක්සේරුව අවසන් කර ඇත. ඒ අනුව දේපළ වාර්ෂික වටිනාකම් ලද පසු 2021 වර්ෂයේ සිට වරිපනම් ගාස්තු පැනවීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ආ) | සභාව විසින් වර්ෂය තුල ආදායම් ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමක් හෝ නව ආදායම් උත්පාදන කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. | නව ආදායම් උත්පාදන වාර්තා කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. | 2019 වර්ෂයේ වරිපනම් ගාස්තු පැනවීම සහ අන්තර් කුට්ටිගල් නිෂ්පාදන කටයුතු විශේෂ ආදායම් උත්පාදන වැඩසටහන් ලෙස සිදු කරන ලද බව දන්වමි. |
| (ඇ) | සභාව විසින් ඉදිකර ඇති ගොඩනැගිලි 05කට අදාළ ඉඩම් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගොඩනැගිලි ඉදිකර ඇති ඉඩම් සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභාව විසින් ගොඩනැගිලි ඉදිකර ඇති ඉඩම් සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. |
| (ඈ) | බස් නැවතුම්පලේ ඉහළ මහල ටෙන්ඩර් ලබාදීමට අවස්ථා 03කදී කටයුතු කර තිබුණද කිසිදු ලංසුකරුවෙකු ඉදිරිපත් නොවීම නිසා ආර්ථිකමය වාසි සභාවට ලබා ගත නොහැකි වී තිබුණි. | ගොඩනැගිලි බදු දීමට කටයුතු කළ යුතු වේ. | අවස්ථා තුනකදී බස්නැවතුම්පල ඉහළ මහල බදු ලබාදීම සඳහා ලංසු කැඳවීම් කළ අතර ඉන් එක් අවස්ථාවක් විවෘත ලංසු කැඳවීමක් සිදු කරන ලදි. නමුත් කිසිදු ලංසුකරුවකු ඒ සඳහා ඉදිරිපත් නොවුණි. ඒ අනුව වාර්ෂික වටිනාකම වන රු.20,000ක් සංශෝධනය සිදු කර දෙන මෙන් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් සිදු කර ඇති බව දන්වමි. |

| | | |
|---|---|---|
| **(ඉ)** 2017 වර්ෂයේ ඉදිකිරීම් නිමකර තිබුණු පොදු වෙළඳ සංකීර්ණයේ ඉහළ මහලේ කඩ කාමර 02ක් සඳහා 2020 මැයි 20 වන විටත් විදුලිය ලබාගෙන නොතිබුණි. | කඩිනමින් විදුලිය ලබාගෙන අදාළ කඩ කාමර බදු දීමට කටයුතු කළ යුතු වේ. | පොදු වෙළෙඳ සංකීර්ණයේ ඉහළ මහලේ කඩ කාමර 02 සඳහා 2020 වර්ෂයේදී විදුලිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|
| පුරප්පාඩු වී ඇති ලේකම් තනතුර සම්පූර්ණ කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණු අතර, ද්වීතියික ශ්‍රේණියට අයත් තනතුරු 04ක්ද ප්‍රාථමික ශ්‍රේණියට අයත් තනතුරු 02ක්ද පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ලේකම් තනතුර හා ද්වීතියික ශ්‍රේණියට අයත් තනතුරු සඳහා බඳවා ගැනීම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කළ යුතු බව දන්වමි. එසේම ප්‍රාථමික ශ්‍රේණියට අයත් තනතුරු සඳහා ගැසට් පත්‍රයේ පළ කර ඉල්ලුම් පත්‍ර කැඳවුවද සුදුසුකම් සහිත අය ඉදිරිපත් නොවූ බැවින් පුරප්පාඩු වී පැවතුණි. |

## 3.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|
| රු.325,000ක් වූ වත්කම් 02ක් වර්ෂ ගණනාවක සිට නිශ්ක්‍රීයව පැවතුණි. | විධිමත් පරිදි සහතික ලබාගෙන නිශ්ක්‍රීය වත්කම් පිළිබඳ අවශ්‍ය කටයුතු කළ යුතු වේ. | අස්ථානගත වී ඇති අංක 159-0891 දරන යතුරු පැදියේ ලියාපදිංචි සහතිකයේ පිටපත් ලබාගත් පසු ඉදිරි කටයුතු සිදු කරන අතර **අංක** RW – 0695 **දරන** ජල බවුසරයේ තක්සේරුව ලැබුණු පසු ඉදිරි කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නවගත්තේගම බස් නැවතුම්පලේ පිහිටි වෙළඳ සංකීර්ණය නවීකරණය කිරීම සඳහා 2017 වර්ෂයේ ප්‍රතිපාදන මත 2017 ඔක්තෝබර් 13 ආරම්භ කර 2017 දෙසැම්බර් 28 කාලය තුල නිමකළ යුතු බවට ගිවිසුම්ගත වී තිබුණු නමුත් ගිවිසුම් ප්‍රකාරව වැඩ නිම නොකර, වැඩ විෂයයන් කිහිපයක් පමණක් අවසන් කර රු.1,925,281ක් ගෙවීම් කර තිබුණි. සාදා නිම කළ කොටස් ආර්ථිකමය වාසි ලබාගැනීමේ තත්ත්වයට පත්ව නොතිබුණු අතර ව්‍යාපෘතියේ ඉතිරි වැඩ අවසන් කර ගැනීම සඳහා 2018, 2019 වර්ෂයන්හිදී ප්‍රතිපාදන ලැබී නොතිබුණු නිසා 2020 මැයි 20 වන විටත් ගොඩනැගිල්ල නිමකර නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු නිම කරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | නවගත්තේගම බස් නැවතුම්පොළ වෙළෙඳ සංකීර්ණයේ ඉතිරි වැඩ නිම කර ගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන ඉල්ලා යෝජනාවක් ඉදිරිපත් කර ඇත. 2018 වර්ෂය තුල ඒ සඳහා ප්‍රතිපාදන නොලද බැවින් 2019 වසර සඳහා නැවත වතාවක් ප්‍රතිපාදන ඉල්ලා ඇති බව දන්වමි. |

# 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර තිබූ අතර, 2019 වර්ෂයේදී සභාවේ සියළු අංශ සම්පූර්ණයෙන් ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | සභාවේ සියළු අංශ ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනය සැලසුම් කර සිදු කළ යුතු වේ. | අභ්‍යන්තර විගණනය සිදු කරන නිලධාරියා විසින් වෙනත් රාජකාරීන්ද සිදු කිරීම හේතුවෙන් 2019 වර්ෂයේදී සියළු අංශ සම්පූර්ණයෙන්ම ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට නොහැකි වු බව පිළිගනිමි. එබැවින් එය නිවැරදි කර ගැනීම සඳහා 2020 වර්ෂයේදී අභ්‍යන්තර විගණන කටයුතු සඳහා වෙනත් නිලධාරියෙකු පත්කර ඇති බව දන්වමි. |